# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1705/26 — 2011 මැයි 12 වැනි බ්‍රහස්පතින්දා - 2011.05.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය

සංශෝධන අංක 03

2005 මාර්තු මස 23 වැනි දින හා අංක 1385/10 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරමි.

14:3:4 උප වගන්තියට අවසන පහත සඳහන් නව අනු වගන්තීන් ඇතුළත් කරනු ලැබේ.

(අ) 2005.03.23 දිනට ප්‍රථම බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට බැඳුනු 2012.07.01 වැනි දිනට ප්‍රථම විශ්‍රාම යැමට නියමිත අයවලුන් සේවා ව්‍යවස්ථාවේ පනවා ඇති දෙවන භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමෙන් නිදහස් කරනු ලැබේ.

(ආ) සෙසු අය 2012.07.01 වැනි දිනට ප්‍රථම බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාවේ සඳහන් දෙවන භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කළ යුතුය.

(ඇ) 2012.07.01 වැනි දින දක්වා පමණක් සියලුම බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා නිලධාරීන්ට දෙවන භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමකින් තොරව ස්වකීය වැටුප් වර්ධක උපයා ගැනීමට සහ නියමිත උසස්වීම් ලබා ගැනීමට හිමිකම් ලබා දිය යුතුය.

එස්. අලවි මව්ලානා,
ආණ්ඩුකාරතුමා,
බස්නාහිර පළාත.

2011 මැයි මස 05 වැනි දින,
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
4 වැනි මහල, යුනිටි ප්ලාසා ගොඩනැගිල්ල,
කොළඹ - 04.

05-668

1A - PG 001240— 340 (2011/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.